# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2086/13 - 2018 අගෝස්තු මස 28 වැනි අඟහරුවාදා - 2018.08.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(1) ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා සඳහා විෂයයන් හා කාර්යයන් පැවරීම මෙහි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි වහාම ක්‍රියාත්මක විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(5) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජෝන් ඊ. අමරතුංග,
සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය.

2018ක් වූ අගෝස්තු මස 23 වැනි දින.

**උපලේඛනය**

**ගරු රංජිත් අලුවිහාරේ, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍ය.**

| *කාර්යයන් සහ කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 1. අමාත්‍යතුමාගේ උපදෙස් ඇතිව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක දේශීය ව්‍යාපෘති/වැඩ සටහන් සම්පාදනය, අධීක්ෂණය හා ඇගයීම<br>2. දිවයින පුරා පවතින නීත්‍යානුකූල නොවන සංචාරක ව්‍යාපාරයේ යෙදී සිටින අවිධිමත් අංශය | | |

1A - G 28369 — 367 (2018/08)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

**ගරු රංජිත් අළුවිහාරේ, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍ය.**

| *කාර්යයන් සහ කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| (උදා. හෝටල්, ආපන ශාලා, මග පෙන්වන්නන් සහ සංචාරක ඒජන්තවරු යනාදිය) ලියාපදිංචි කිරීමේ යෝජිත ක්‍රියාවලියේ සාර්ථකත්වය තහවුරු කරනු වස් 2018 දෙසැම්බර් වන විට ඔවුන් විධිමත් අංශ බවට පත්වීම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමඟ අධීක්ෂණය | | |
| 3. දේශීය සංචාරක ක්‍රියාකාරකම් ප්‍රවර්ධන වැඩ සටහන්වල ප්‍රගතිය නිරීක්ෂණය හා සමාලෝචනය | | |
| 4. ක්‍රිස්තියානි ආගමික කටයුතුවලට අදළව ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක වැඩසටහන් සම්පාදනය, අධීක්ෂණය හා ඇගයීම. | | |
| 5. සංචාරක හෝටල් සහ චාරිකා නියෝජිත ආයතන වර්ගීකරණ වැඩපිළිවෙල අවධාරණය කරමින් සංචාරක හෝටල් සහ සංචාරක නියෝජිත ආයතනවල සංවර්ධනය සහ නියාමනය. | | |
| 6. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කාර්යයන් සමග සමීප සහ ඵලදායී සම්බන්ධතාවයක් පවත්වා ගැනීම හරහා එහි ප්‍රගතිය නිරන්තරයෙන් සමාලෝචනය කිරීම, අධීක්ෂණය, ඇගයීම සහ ඵලදායීතාව සහතික කිරීම. | | |
| 7. සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ පුහුණු කිරීම් ඇතුළු මානව සම්පත් සංවර්ධනයට අදළ කාර්යයන් | | |
| 8. රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් අමාත්‍යාංශයේ සහ විශේෂයෙන් ඒ යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අදළ සියළුම ක්‍රියාකාරකම් සහ කටයුතු පිළිබඳ මනා ලෙස දැනුවත් වීම. | | |
| 9. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමඟ එක්ව ශ්‍රී ලංකා සංචාරක උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම 2017-2020 ඉදිරියට ක්‍රියාත්මක කිරීම. | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**ගරු රංජිත් අලුවිහාරේ, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍ය.**

| *කාර්යයන් සහ කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 10. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන සංචාරක නිකේතන (රිසෝර්ට්), සංචාරක කලාප සහ අනෙකුත් සංචාරක ආකර්ෂණයට ලක්වන දේපල වෘත්තීමය වටිනාකමක් සහිතව පවත්වාගෙන යාම<br><br>11. ඉහත සඳහන් දේට අමතරව කලින් කලට අමාත්‍යවරයා විසින් පවරනු ලබන කාර්යයන් සහ කර්තව්‍යයන් | | |

09 - 270

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.